# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,321 — 1965 පෙබරවාරි 12 වැනි සිකුරාද — 1965.2.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පලාත් පාලනය

## පලාත් පාලන නිවේදන

L. D.—B. 17/57.
L. G. D.—AC. 29/1.

### නගර සභා ආඥාපනත

#### 184 වැනි වගන්තිය යටතේ වූ ආඥාවයි

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පලාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමැති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම,

කොලොන්නාව නගර සභාවේ සභාපති තැන්පත් වින්තුර සිල්වාගේ ගුණදාස සිල්වා මහතා විසින්—

(අ) එකී ආඥාපනතෙන් පනවා ඇති රාජකාර්‍ය කටයුතු ඉටු කිරීම ඕනෑකමින් පැහැර හරිනු ලැබ තිබෙන බවද,

(ආ) සභාපති ධුරයේ රාජකාරි අදක්ෂ ලෙස හා නොනිසි ලෙස කර තිබෙන බවද,

ඒත්තු ගැනීමට සෑහෙන සාක්ෂි ඇති බැවින් මේ ආඥාවෙන් එකී වින්තුර සිල්වාගේ ගුණදාස සිල්වා මහතා එකී නගර සභාවේ සභාපති ධුරයෙන් මෙයින් ඉවත් කරමි.

ඒ. පී. ජයසූරිය,
පලාත් පාලනය සහ සවදේශ කටයුතු පිළිබඳ ඇමැතිවරයා.

1965 පෙබරවාරි මස 12 දින,
කොළඹ දී ය.
2-524


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

149—ආර් 4158—4,724 (65/2)